වගා සහනාධාර චක්‍රලේඛ අංක 68

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2010.12. 31 දින.

සියළුම ප්‍රාදේශීය කළමනාකරුවන්

## තේ නැවත වගාව සහ බෝග පුනරුත්ථාපනය( පාළු සැපයීම) යටතේ ගෙවනු ලබන දිරිදීමනා මුදල වැඩිකිරීම.

චක්‍රලේඛයේ පරමාර්ථය :

| |
|---|
| දිරිදීමනාව වැඩිකිරීම තුළින් කුඩා තේ වතු හිමියන්ට තේ නැවත වගාව සහ පාළු සැපයීම කෙරෙහි වැඩි පෙළඹවීමක් ඇති කිරීම හා ඒ තුළින් තේ ඉඩම්වල ඵලදායිතාවය වර්ධනය කිරීම. |

තේ නැවත වගාව හා බෝග පුනරුත්ථාපනය ( පාළු සැපයීම) සඳහා ගෙවනු ලබන දිරිදීමනා මුදල 2011.01.01 දින සිට නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් බලපවත්නා පරිදි වැඩිකරනු ලැබේ

1. <u>තේ නැවත වගාව</u>

(අ) තේ නැවත වගාව සඳහා ගෙවනු ලබන දිරිදීමනා මුදල 2011.01.01 දින සිට නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් බලපවත්නා පරිදි උඩරට/මැදරට දිස්ත්‍රික්ක සඳහා රු: 250,000/- ක්ද පහත රට දිස්ත්‍රික්ක සඳහා රු:240,000/- ක්ද වන පරිදි සංශෝධනය කර ඇති අතර එම මුදල පහත දැක්වෙන අයුරින් ගෙවීමට කටයුතු කළ යුතුය.

| වාරිකය | 2011.01.01 දින සිට නිකුත් කරන අවසරපත්‍ර සඳහා ගෙවිය යුතු මුදල හෙක්./රුපියල් | |
|---|---|---|
| | උඩරට/මැදරට | පහත රට |
| බිම් සැකසීම | 70,000 | 70,000 |
| පස සාරවත් කිරීම-1 | 25,000 | 22,000 |
| පස සාරවත් කිරීම -11 | 35,000 | 33,000 |
| තේ වගා කිරීම | 95,000 | 93,000 |
| නඩත්තුව | 25,000 | 22,000 |
| එකතුව | 250,000 | 240,000 |

උඩරට /මැදරට දිස්ත්‍රික්ක: මහනුවර, මාතලේ, නුවරඑළිය ,බදුල්ල සහ මොනරාගල
පහතරට දිස්ත්‍රික්ක : මාතර , ගාල්ල, රත්නපුර, කළුතර , කොළඹ, කෑගල්ල,හම්බන්තොට සහ කුරුණෑගල

(ආ) තේ නැවත වගාව වෙනුවෙන් 2010.12.31 දක්වා නිකුත් කරන ලද අවසරපත්‍ර වෙනුවෙන් 2006.09.21 දිනැති වගා සහනාධාර චක්‍රලේඛ අංක 64 මගින් දැනුම් දී ඇති පරිදි දැනට ගෙවනු ලබන ආධාර මුදල් ප්‍රමාණයම පහත සඳහන් පරිදි ඉදිරියටත් ගෙවිය යුතුය.

| වාරිකය | 2010.12. 31 දින දක්වා නිකුත් කරන ලද අවසරපත්‍ර සඳහා ගෙවිය යුතු මුදල හෙක්./රුපියල් | |
|---|---|---|
| | උඩරට/මැදරට | පහත රට |
| බිම් සැකසීම | 50,000 | 50,000 |
| පස සාරවත් කිරීම-1 | 22,000 | 20,000 |
| පස සාරවත් කිරීම -11 | 93,000 | 90,000 |
| තේ වගා කිරීම | 22,000 | 20,000 |
| නඩත්තුව | 13,000 | 10,000 |
| එකතුව | 200,000 | 190,000 |

(ඇ) තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට එක් අවසරපත්‍රයක් පමණක් නිකුත් කරනු ලබන අතර එහි උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 01 කට සීමාවේ.

2. <u>බෝග පුනරුත්ථාපනය ( පාළු සැපයීම)</u>

(අ) බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම) සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල 2011.01.01 දින සිට නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් බලපවත්වන පරිදි සියළුම තේ වගා දිස්ත්‍රික්ක සඳහා පැලයකට රු: 25.00 ක් වන පරිදි සංශෝධනය කර ඇති අතර එම මුදල පහත දැක්වෙන අයුරින් ගෙවීමට කටයුතු කළයුතුවේ.

| | | |
|---|---|---|
| 1. | වාරිකය - පාළු පැල සිටුවීම | පැලයකට රු:15.00 |
| 2. | වාරිකය - වර්ෂයක් තුල සිටවූ පාළු පැල නඩත්තු කිරීම | පැලයකට රු:10.00 |
| | එකතුව: | පැලයකට රු:25.00 |

(ආ) බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම ) සඳහා එක් ඉඩම් හිමියෙකුට වසරකට එක් අවසරපත්‍රයක් පමණක් නිකුත් කරනු ලබන අතර එහි උපරිම බිම් ප්‍රමාණය අක්කරය(හෙක්:0.4047)කට සීමාවේ.

(ඇ) සියළුම වගා ප්‍රදේශ සඳහා අක්කරයකට පැල 1000 දක්වා අවසරපත්‍ර නිකුත් කළ හැකිය.

(ඇ) බෝග පුනරුත්ථාපනය ( පාළු සැපයීම ) වෙනුවෙන් 2010.12.31 දින දක්වා නිකුත් කරන ලද අවසරපත්‍ර වෙනුවෙන් වගා සහනාධාර චක්‍රලේඛ අංක 59 මගින් දැනුම්දී ඇති පරිදි දැනට ගෙවනු ලබන ආධාර මුදල් ප්‍රමාණයම පහත සඳහන් පරිදි ඉදිරියටත් ගෙවිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1. | වාරිකය | - පාළු පැල සැපයීම | පැලයකට රු:7.00 |
| 2. | වාරිකය | - වර්ෂයක් තුල සිටවූ පාළු පැල නඩත්තු කිරීම | පැලයකට රු::3.00 |
| | | එකතුව : | පැලයකට රු:10.00 |

3. තේ නැවත වගාව හා බෝග පුනරුත්ථාපනය (පාළු සැපයීම ) දිරිදීමනා ක්‍රම යටතේ 2011.01.01 දින සිට නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් ඉහත සංශෝධිත දිරිදීමනා මුදල් ප්‍රමාණය අදාල වන බැවින් ඒ අනුව ගෙවීම් කිරීම පිණිස පරිඝණක දත්ත පද්ධතිය සකස් කරගත යුතුය.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථ කළයුතු අතර, අදාල කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමට හා ප්‍රදේශයට අයත් ඔබගේ සියළුම කාර්යාලවල දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමටද පියවර ගන්න.

නොඑල් පද්මසිරි කාරියවසම්
සභාපති

පිටපත්:
1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(ව්‍යාප්ති)
3. සහකාර සාමාන්‍යාධිකාරී(සංවර්ධන)
4. අභ්‍යන්තර විගණක
5. මුදල් කළමනාකරු
6. කළමනාකරු(සැලසුම් /නියමුකරණ)
7. සියළුම මාණ්ඩලික නිලධාරීන්
8. සියළුම ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
9. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
10. ගරු සභාපති/ගරු ලේකම්- සමස්ත ලංකා සමිති සංවිධානය
11. සියළුම ප්‍රාදේශීය සංවිධානවල ගරු සභාපති/ ගරු ලේකම්වරුන්

ඇමුණුම 01

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගාව යෝග්‍යතාවය නිර්නය කිරිම සඳහා මාර්ගෝපදේශය

i. මෙම අනුග්‍රහය යටතේ පස පුනරුත්ථාපනයෙන් තොරව නැවත වගා කිරීමට යෝග්‍යතාවය සළකා බැලිය යුත්තේ ඉඩම් අයිතිය අක්කර 1/2 කට අඩු කුඩා තේ වතු හිමියන් සඳහා පමණි.

ii. මෙම අනුග්‍රහය යටතේ අවසරපත්‍ර ලබාගැනීමට අපේක්ෂාකරන ඉඩම්වල මූලික පරීක්ෂණ අවස්ථාවේදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් මූලික පරීක්ෂණ වාර්තාව සමග RP/NP-4A ආකෘතියෙන් පස සාරවත් කිරීමෙන් තොරව අවසරපත්‍ර ලබාදීම සඳහා නිර්දේශය ලබාදිය යුතුය.

iii RP/NP 4 –A, ආකෘතියේ දක්වා ඇති දෘෂ්‍ය නිර්නායක 6 ක් පාදක කොටගෙන එක් එක් නිර්නායකයට අදාලව ඉඩමේ පවත්නා තත්ත්වය සලකාබලා ලකුණු ලබාදීම සිදුකල යුතුය.

iv. මෙම නිර්නායක 6 ට ඒකාබද්ධව සලකාබලන විට ලැබිය හැකි උපරිම සමස්ථ ලකුණු ප්‍රමාණය 17 කි. සලකාබලන ඉඩමේ සමස්ථ ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා විටදී පමණක් පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා නිර්දේශ ලබාදිය හැකිය.

v. මෙම අනුග්‍රහය යටතේ සලකා බැලීමට සුදුසුකම් ලබන යම් කුඩා තේ වතු හිමියෙකු පස සාරවත් කිරීම සහිතවම තේ නැවත වගා කිරීමට සූදානම් නම් මෙම RP/NP 4- A ආකෘතිය මූලික පරීක්ෂණ අවස්ථාව සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර මූලික පරීක්ෂණ වාර්තාවේ වගාකරු පස සාරවත් කිරීම සහිතව නැවත වගා කිරීමට කැමති බව සඳහන් කිරීමට කටයුතු කළයුතුය.

RP/NP/4A

## පස පුනරුත්ථාපනයෙන් තොරව තේ අළුත් වගාවට /තේ නැවත වගාවට යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව

(පස පුනරුත්ථාපනයෙන් තොරව තේ වගා කිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් සඳහා සැපයිය යුතු වේ.)

ඉල්ලුම්කරුගේ නම : ............................................................ අංකය [ ]

ඉඩමේ නම : ............................................................

01 තේ අළුත් වගාවට/නැවත වගාවට * යෝජිත ඉඩමේ දනට ඇති වෘක්ෂලතාවල වර්ධනය

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි |
|---|---|---|
| 0 | 1 | 2 |

02. යෝජිත ඉඩමේ දනට පවතින වෘක්ෂලතා මගින් බිම් ආවරණය

| 0.25% | 26-50% | 51-75% | 76-100% |
|---|---|---|---|
| 0 | 1 | 2 | 3 |

03. පසේ ස්වභාවය

| වැලි අධික | බොරළු අධික | මැටි අධික | ලෝම |
|---|---|---|---|
| 1 | 2 | 2 | 3 |

04. පසේ ගැඹුර

| <2’ | 2’-3’ | 3’< |
|---|---|---|
| 1 | 2 | 3 |

05. මතුපිට පස සෝදා පාළුවීමේ තත්ත්වය

| අධිකයි | මධ්‍යස්ථයි | සුළුයි |
|---|---|---|
| 0 | 1 | 2 |

06. මතුපිට පසේ සරු බව

| දුර්වලයි | මධ්‍යස්ථයි | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| 1 | 2 | 3 | 4 |

සමස්ත ලකුණු එකතුව

ඉහත ලකුණු පාදකව මෙම ඉඩමේ පස පුනරුත්ථාපනය සහිතව / රහිතව * හෙක්. ......................................
(අක්. ............... රූ. ............. පර්. ...............) ක තේ අළුත් වගා /තේ නැවත වගා* කිරීමට නිර්දේශ කරමි.

දිනය:- ..........................

..................................................
තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි

- ❖ නිර්නායකයන්ට අදාල ලකුණ කවයකින් සලකුණු කරන්න.
- ❖ මුළු ලකුණු එකතුව ලකුණු 10 ක් හෝ ඊට වැඩි නම් පස පුනරුත්ථාපනය රහිතව තේ අළුත් වගා / නැවත වගාව සඳහා නිර්දේශ කල හැක.
- ❖ අදාල නොවන වචනය කපා හරින්න.